# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,316 — 1962 සැප්තැම්බර් 28 වැනි සිකුරාද — 1962.9.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1361 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1361 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1362 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |

| | පිට |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1363 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1365 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | 1367 |


## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 403**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය :—

ඒ. 244/62.

සිවිල් සේවක එස්. බී. සේනානායක මහතා 1962 අගෝස්තු මස 3 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 301/61.

සිවිල් සේවක ආර්. බී. වීරකෝන් මහතා 1962 ජූනි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය ලේකම් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 77/62.

සිවිල් සේවක යූ. ඒ. ගුණරත්න මහතා 1962 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

ඒ. 228/62.

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ දිසාපති තැන්පත් සිවිල් සේවක ඊ. ඇම්. විජේනායක මහතා 1962 ජූලි මස 28 වැනි දින සිට ස්වකීය රාජකාරිවලට අතිරේකව සිවිල් සේවක එච්. එල්. ගුණසේකර මහතා රාජකාරී භාර ගන්නා තුරු හෝ නැවත නියමයක් කරනතුරු හෝ කෑගල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ දිසාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. 288/62.

සිවිල් සේවක එච්. එල්. ගුණසේකර මහතා 1962 අගෝස්තු මස 17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කෑගල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ දිසාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. 185/61.

1961 ඔක්තෝබර් මස 1 වැනි දින සිට වෛද්‍ය වී. පී. එච්. ගුණරත්න මහතා සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා) වශයෙන්.

ඒ. 220/62.

1962 ජූලි මස 14 වැනි දින සිට ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ආණ්ඩුවේ අධිනීතිඥවර වී. ඊ. තාමෝදරම් මහතා එම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා වශයෙන්.

ඒ. 220/62.

1962 ජූලි මස 14 වැනි දින සිට ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ ආණ්ඩුවේ අධිනීතිඥවර ඇල්. බී. ටී. ප්‍රේමරත්න මහතා එම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ආණ්ඩුවේ අධිනීතිඥවරයා වශයෙන්.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 සැප්තැම්බර් මස 22 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
නෑ. පෙ. 500.

9-1027

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 404**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේඑම්. 2/56(III).

ඩී. ඊ. ධම්සේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු හෝ ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් කේ. වී. සුවර්ණධිපති මහතා 1962 සැප්තැම්බර් මස 15 වැනි දින සිට 22 වැනි දින දක්වා බලපිටියේ මහෙස්ත්‍රාත් සහ රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ.37/48.

එස්. විජයකනාදන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 සැප්තැම්බර් මස 14 වැනි දින සිට කුලියාපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 14096 දරණ නඩුවේ

(3) ඊ. ඒ. ජේ. ඩබ්ලිව්. සේරසිංහ මහතා ගාලු අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(4) ඩී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කොතලාවල මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(5) කේ. ඒ. ද ආබෲ රාජපක්ෂ මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(6) සී. නඩරාජා මහතා ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නාවල පිටියේ ප්‍රාදේශීය අධිකාරි ධුරය දරණ කාලය තුළ මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චය කරුවකු වශයෙන් ද,

(7) එස්. ජේ. වී. වීරරත්න මහතා ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුරාධපුරයේ ප්‍රාදේශීය අධිකාරි ධුරය දරණ කාලයතුළ අනුරාධපුර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

9-984

---

**1962 අංක 406**

අංකය : ඩී. 32/රෙක් ව්.

## රාජකීය ලංකා නාවික හමුදාවේ නිලධාරීන් ස්ථිර කිරීම්

පහත සඳහන් නිලධාරියා 1961 සැප්තැම්බර් 1 වැනි දින සිට උප ලයිතන් පදවියේ ස්ථිර කරන ලදී :—

වැඩබලන උප ලයිතන් බී. වයි. සී. ශ්‍රී ලේකම්වසම්, රා.ලං.නා.හ.

මො. වී. ජේපා. අබයකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩබලන ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් 19 වෙනිදා,
කොළඹ දීය.

9-1023/1

---

**1962 අංක 407**

අංකය : ඩී. 32/රෙක් ව්.

## රාජකීය ලංකා නාවික හමුදාවේ නිලධාරීන් ස්ථිර කිරීම්

පහත සඳහන් නිලධාරියා 1962 සැප්තැම්බර් 1 වැනි දින සිට උප ලයිතන් පදවියේ ස්ථිර කරන ලදී :—

වැඩබලන උප ලයිතන් ආර්. රාසයියා, රා.ලං.නා.හ.

පහත සඳහන් නිලධාරියා 1962 සැප්තැම්බර් 1 වැනි දින සිට උප ලයිතන් (සැ) පදවියේ ස්ථිර කරන ලදී :—

වැඩබලන උප ලයිතන් (සැ) පී. ජයසිංහ, රා.ලං.නා.හ.

මො. වී. ජේපා. අබයකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩබලන ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් 19 වෙනිදා,
කොළඹ දීය.

9-1023/2

---

**1962 අංක 408**

තම්බිසයිබු අයිඩෲස් මොහමඩ් ජුනයිඩ් මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

9-884



**1962 අංක 409**

ජයවර්ධන ඒකනායක මුදියන්සෙරාලහාමිලාගේ ඉන්ද්‍රවංස ඒකනායක මහතා කෑගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

9-873

---

# ආණ්ඩුවේ නිවේදන

## 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත

**ආඥාව**

1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) හා (8) වෙනි උපවගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, වැඩ බලන අධිකරණ අමාත්‍ය ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කෑගලු දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරලේ, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි ඕතර සහ ගම්දොලහ පත්තු ගම් ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත් කරමි :—

(1) වට්ටාරම පදිංචි පූජ්‍ය, හපුගොඩ සිද්ධත්ථ ස්වාමීන් වහන්සේ.
(2) මකුද්දල පදිංචි, ජයසූරිය මුදියන්සේලාගේ ගුණරත්න.
(3) රාගල්කන්ද පදිංචි, මොහොට්ටාල්ලාගේ මොහොට්ටි අප්පුහාමි.
(4) දුම්බුළුවාවක පදිංචි, බස්නායක රාල්ලාගේ පියසේන බස්නායක.
(5) ඊරියමඩිත්ත පදිංචි, රණවි අච්චිල්ලාගේ කිරිමුදියන්සේ.
(6) වද්දෙනිය පදිංචි, චන්ද්‍රසේකර මුදියන්සේලාගේ ජයසිංහ බණ්ඩා.
(7) රත්වල පදිංචි, පුලිහින් අච්චිල්ලාගේ පුංචිනිලමේ.
(8) තෙලුන්දෙනිය පදිංචි, වීරසේකර සෙනෙවිරත්න මුදියන්සේලාගේ සෙනෙවිරත්න.
(9) මංගෙදර පදිංචි, දහනක විදාන රාල්ලාගේ ඩිංගිරි අප්පුහාමි.
(10) පල්ලෙවෙල පදිංචි, නාරංගොඩ ලේකම්ලාගේ අප්පුහාමි.
(11) ඇදුරාපොත පදිංචි, රාජපක්ෂ ගමරාල්ලාගේ ඩිංගිරි බණ්ඩා.
(12) හපුගස්තැන්න පදිංචි, පල්ලේගමයලාගේ ජේම්ස් සිංඤෝ,
(13) හැලමඩ පදිංචි, සිලමන් ආරච්චිගේ චාර්ල්ස් සිංඤෝ.
(14) හත්නාගොඩ පදිංචි, විජේකෝන් මුදියන්සේලාගේ පුංචි නිලමේ විජේකෝන්.
(15) දේවාලේගම පදිංචි, දොන් ඩැනියෙල් අල්විස් පස්කුවෙල් පණ්ඩිතරත්න.
(16) ගොඩපොල පදිංචි, තෙන්නකෝන් මුදියාන්සේලාගේ ඩිංගිරි බණ්ඩා.
(17) වද්දේනිය පදිංචි, පතිරාජ මුදියාන්සේලාගේ පියදාස.
(18) බෙලිගල පදිංචි, මාපාමුදියාන්සේලාගේ රණතුංග.
(19) මාම්පිට පදිංචි, බ්‍රාහමණ අච්චිල්ලාගේ කිරිබණ්ඩා.
(20) තෙලුන්දෙනිය පදිංචි, සිංගන්කුට්ටි අච්චිල්ලාගේ අරනෝලිස්.
(21) බෝදාවල පදිංචි, වරකාවෙ දුරයලාගේ කරුණාරත්න.
(22) ගස්නාව පදිංචි, සෙනෙවිරත්න අතාඋද.
(23) වේරගොඩ පදිංචි, කලංචියලාගේ බබානිස්.
(24) පුස්සැල්ල පදිංචි, වීරක්කොඩි අච්චිල්ලාගේ මුදියන්සේ.
(25) ඊරියමඩිත්ත පදිංචි, එල්. ආර්. පුංචිරාල.
(26) වේරගොඩ පදිංචි, ඊ. ඩී. චාර්ලිස්.
(27) බටුවත්ත පදිංචි, පී. කිරිබණ්ඩා.
(28) නාවගමුව පදිංචි, එච්. ඒ. කුලරත්න.

(ආ) ඉහත කී මණ්ඩලයේ සභාපති වශයෙන් මකුද්දල පදිංචි, ජයසූරිය මුදියන්සේලාගේ ගුණරත්න මහතා පත් කරමි. තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරියයුතු කාලසීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පලකරනු ලබන දින සිට අවුරුදු 2 ක් විය යුතුයයි නිශ්චය කරමි.

ඒ. පී. ජයසූරිය,
වැඩබලන අධිකරණ අමාත්‍ය.

1962, සැප්තැම්බර් මස 17 දින,
කොළඹදීය.

9-960

## බන්ධනාගාර ආඥාපණත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පණතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පණතේ 32(1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උපලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තා මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාලය කට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයකු වශයෙන්, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

නි. බ. මා. සෙනෙවිරත්න,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශය,
1962 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ 7.

### උපලේඛනය

| I | | II |
|---|---|---|
| බදුල්ල බන්ධනාගාරය | ... | ආර්. ඇම්. අප්පුහාමි මහතා. |

9-878

---

## බන්ධනාගාර ආඥා පණත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පණතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥාපනතේ 32(1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උපලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තා, මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාලයකට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශය,
1962 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ 7.

### උපලේඛනය

| I | | II |
|---|---|---|
| නුවර බෝගම්බර බන්ධනාගාරය | ... | නීතිඥ පී. මාපලගම මහතා |

9-999

---

අංකය :— ඊබී/ඒ-258

පහත සඳහන් පත්කිරීම් කිරීමට කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා සතුටුවී ඇත :—

අම්පාරේ පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත එම්. එල්. ජේ. වික්‍රමරත්න මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1962 අගෝස්තු මස 1 වැනි දින සිට අම්පාරේ පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥාපණත යටතේ ප්‍රාදේශීය අධිකාරි.

පුත්තලම පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත වී. රාමනාදන් මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1962 අගෝස්තු මස 1 වැනි දින සිට පුත්තලම පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥා පණත යටතේ ප්‍රාදේශීය අධිකාරි.

වවුනියාව පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත එම්. ජේ. එම්. මුෂින් මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1962 ජූනි මස 29 දින සිට නැවත නියමයක් කරනතුරු, වවුනියාව පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥා පණත යටතේ ප්‍රාදේශීය අධිකාරි.

කෑගල්ල පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත එච්. එල්. ගුණසේකර මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1962 අගෝස්තු මස 17 වන දින සිට කෑගල්ල පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥා පණත යටතේ ප්‍රාදේශීය අධිකාරි.

වී. එල්. වීරසිංහ,
ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 14 දින,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

9-896

---

අංකය : ඊ. බී. ඒ-204-2.

අර්ථ නිරූපන ආඥාපණතේ දෙවන පරිච්ඡේදය 10බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත්කිරීම් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අම්පාරේ පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත එම්. එල්. ජේ. වික්‍රමරත්න මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1962 අගෝස්තු මස 1 වැනි දින සිට අම්පාරේ පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කල්, අම්පාරේ පාලන දිස්ත්‍රික්කයේ රේගු අයකැමි සහ අම්පාරේ පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් කැඩී බිඳී ගිය යාත්‍රා භාරගන්නා නිලධාරි.

පුත්තලම පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත වී. රාමනාදන් මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1962 අගෝස්තු මස 1 වැනි දින සිට, පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කල්, පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ රේගු අයකැමි, පුත්තලම පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් කැඩී බිඳී ගිය යාත්‍රා භාරගන්නා නිලධාරි සහ පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ අතිරේක පොලිස් අධිකාරි.

වවුනියාව පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත එම්. ජේ. එම්. මුෂින් මහතා 1962 ජූනි මස 29 දින සිට නැවත නියමයක් කරනතුරු, වවුනියාව පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කල්, මුලතිව්හි රේගු අයකැමි, මුලතිව්හි නියෝජ්‍ය මාස්ටර් ඇටෙන්ඩන්ට්, මුලතිව්හි කැඩීබිඳීගිය යාත්‍රා භාරගන්නා නිලධාරි සහ වවුනියා පාලන දිස්ත්‍රික්කයේ අතිරේක පොලිස් අධිකාරි.

කෑගල්ල පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත එච්. එල්. ගුණසේකර මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1962 අගෝස්තු මස 17 වන දින සිට, කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කල්.

ඇම්. ජේ. පෙරේරා,
ස්ථිර ලේකම් වෙනුවට.

1962 සැප්තැම්බර් මස 10 දින,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

9-899

---

## 1958 අංක 12 දරණ තේ ආධාර මුදල් පනත

### තේ ආධාර මුදල් උපදේශක මණ්ඩලය

1958 අංක 12 දරණ තේ ආධාර මුදල් පණතේ 9 වැනි ඡේදය යටතේ සංස්ථාපිත තේ ආධාර මුදල් උපදේශක මණ්ඩලයේ (නිල බලයෙන්) සාමාජිකයකු වශයෙන් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමා විසින් 1962 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට තවත් අවුරුදු තුනක කාලයකට ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ඞී. එල්. ගන් මහතා පත් කරන්නට යෙදුන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇම්. ශ්‍රී කාන්තා,
අති. නිත්‍ය ලේකම්.
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශය.

1962 සැප්තැම්බර් මස 20 දින,
කොළඹ දී ය.

9-981

ඇල්.ඩී.—බී. 40/44.

## පඩි පාලක සභා ආඥපනත

### 8 වන වගන්තිය යටතේ ආඥවයි

කම්කරු හා ජනසතු සේවා ඇමති මයිකල් පෝල් ද සොයිසා සිරිවර්දන වන මම (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥපනතේ 8 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී ආඥපනතේ 6 වන වගන්තිය යටතේ පනවා 1962 අප්‍රියෙල් මස 19 වන දින අංක 13,027 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥව අදාළ වන්නාවූ සහ එහි වඩාත් සවිස්තරව දක්වා ඇත්තාවූ නූල් කැටීමේ, රෙදි විවීමේ සහ (මේස් බැනියම් ආදී භාණ්ඩ ඇතුළු) ඇඳුම් සෑදීමේ කර්මාන්තය සඳහා පඩි පාලක සභාවක් මෙම ආඥවෙන් පිහිටුවමි.

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්දන,
කම්කරු හා ජනසතුසේවා ඇමති.

1962 සැප්තැම්බර් මස 13 වන දින,
කොළඹ දීය.

9-855

## කෘෂිකර්ම නිෂ්පාදන (රෙගුලාසි) පණතේ 2 වැනි වගන්තිය යටතේ නිවේදනයයි

1948 පෙබරවාරි 5 වැනි දින අංක 9,828 දරණ ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශනයෙන් සංශෝධිත ප්‍රකාර, වර්ෂ 1939 යේ අංක 29 දරණ ගොවි ද්‍රව්‍ය පාලනය පිළිබඳ ආඥපණතේ 2 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තියෙන් (අර්ථ නිරූපන පණතේ 2 වැනි පරිච්ඡෙදයේ 10 බී වගන්තියත් සමග කියවෙන පරිදි), මට පැවරී ඇති බලතල අනුව, වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති තැන්පත් විකිරි බන්ඩා ඉලංගරත්න වන මම, වර්ෂ 1939 යේ අංක 29 දරණ ගොවි ද්‍රව්‍ය පාලනය පිළිබඳ ආඥපණත ක්‍රියාවේ යෙදවීම සඳහා, පහත සඳහන් නිලධාරීන්, ඔවුන්ගේ රාජකාරිවලට අතිරේක වශයෙන්, ගොවි ද්‍රව්‍ය අලෙවි කිරීමේ සහකාර කොමසාරිස්ධුර වලට පත් කරන බව මෙයින් දැනුම් දෙමි :—

ඉකේ. යූ. කමල්ගොඩ මහතා
ඩබ්ලිව්. ජේ. ඩයස් මහතා

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

1962 සැප්තැම්බර් මස 15 දින,
කොළඹ දීය.

9-858

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 8/62 දරන අපනයන පාලන දැන්වීම

### පොල් පුන්නක්කු අපනයනය

1962 මැයි මස 17 වෙනි දින අංක 13,122 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 5/62 දරන අපනයන පාලන දැන්වීම සම්බන්ධයෙනි. විදේශයන්ට පොල් පුන්නක්කු අපනයනය සඳහා මෝල් හිමියන් වෙත විශේෂ වෙන්කිරීම් දී ඇති බව පොල් පුන්නක්කු නැව් ගත කරන්නන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. මෝල් හිමියන් නොවන නැව්ගත කරන්නන් අපනයන බලපත්‍ර සඳහා අයදුම් පත් එවන විට මෝල් හිමියන් ගෙන් පුන්නක්කු මිළට ගත් බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

මොනම හේතුවක් උඩ හෝ ඔවුන්ට දී ඇති වෙන්කිරීම් ප්‍රමාණයන්ට වැඩිමනත්ව අපනයනය සඳහා නැව්ගත කරන්නන් වෙත විකිණීමේ කොන්ත්‍රාත්තුවලට මෝල්හිමියන් නොබැඳිය යුතුය.

අපනයන බලපත්‍ර සඳහා අයදුම් පත් 1962 ඔක්තෝබර් මස 15 වෙනි දින දක්වා භාරගනු ලැබේ. අපනයන බලපත්‍ර 1962 දෙසැම්බර් 31 වෙනිදට ප්‍රථම නැව්ගත කිරීම සඳහා වලංගුවේ.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 සැප්තැම්බර් මස 20 වෙනි දින,
කොළඹ දීය.

9–1000/1

## අංක 9/62 දරන අපනයන පාලන දැන්වීම

අපනයන බලපත්‍ර සඳහා " ක්‍යූ " ආකෘති පත්‍රයෙහි අයදුම් පත් ඉදිරිපත් කරන විට පහතින් පළවන ආකෘති පත්‍රයෙහි අවශ්‍ය තොරතුරු පිටපත් දෙකකින් සැපයිය යුතු බව අපනයනකයින් වෙත මෙයින් දන්වමි.

1962 ඔක්තෝබර් මස 31 වෙනි දිනෙන් පසු අපනයනකයින්ට මෙම දෙපාර්තමේන්තුවෙන් " ක්‍යූජ් " ආකෘතිපත්‍ර සපයනු නොලැබේ.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 සැප්තැම්බර් මස 20 ද,
කොළඹ දී ය.

පිටපත් දෙකකින් යුතුව සැපයීම පිණිසය.

QA ආකෘති පත්‍රය

### අපනයන බලපත්‍ර ඉල්ලුම් පත

(" Q " ආකෘති පත්‍රය ද මීට අනුබද්ධ කොට එවිය යුතු ය)

දිනය : ............................................

ටැලිෆෝන් අංකය : .................

1. ඉල්ලුම්කරු : ..................................................................................................

2. ලිපිනය : ..................................................................................................

| | |
|---|---|
| 3. දැනට ඔඩරය පාලක වෙත ලියාපදිංචි කොට ඇත්නම් එහි දිනය සඳහන් කරන්න ... ... ... ... | |
| 4. ඔඩරය එවූ නියෝජිතයාගේ හෝ මිළයට ගන්නාගේ නම හා ලිපිනය ... | |
| 5. වෙළඳ ද්‍රව්‍යය : ...................................................... | ..................................................ට නැවෙන් යැවීම සඳහා |
| 6. ප්‍රමාණය : ...................................................... | තත්ත්වය හා වර්ගය : ...................................... |
| 7. නැවට පටවන දිනය (අනුමාන වශයෙන්) හෝ (නැවට පටවන කාල පරිච්ඡෙදය) ... ... ... ... | |

8. විකුණන මිළ—ගනු දෙනුව සිදුවූ ව්‍යවහාර මුදල් වර්ගයෙන්. ඊට අදල කොන්දේසි හා විනිමය ප්‍රමාණය.................................................. ..................................................විනිමය අනුව පිරිවැය රක්ෂණ ගාස්තු, නැව් ගාස්තු/පිරිවැය සහ වාහන ගාස්තු (සහ කොමිස්) ඇතුළුව .................................................. ට ..................................................බැගිනි.

9. (අ) ..................................................හි රුපියල් වටිනාකම රුපියල්...............

(ආ) අඩුව—

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) නැව් ගාස්තු | ... | ... | ... | ... රු. | |
| (ii) රක්ෂණ ගාස්තු | ... | ... | ... | ... රු. | |
| (iii) නියෝජිතයන්ගේ කොමිස් (......................%) | | | ... | ... රු. | |
| (iv) | | | | ... රු. | |

10. සියල්ල අඩුකළ විට නැව් ගාස්තු රහිත මිළ ... ... ... රුපියල්

11. අවම මිළ ඉක්මවා සිටි ගණන (අදල වේ නම්) ... ... ... රුපියල්

| | |
|---|---|
| 12. ගෙවන ක්‍රමය : අණකරයක් මගින් ද (භාවිතය සඳහන් කරන්න) විදුලි මුදල් මාරුවක් මගින් ද, එසේ නැතහොත් අන්‍ය මාර්ගයකින් ද යන බව (අවශ්‍යවී නම් ණයවර ලිපියේ විස්තර ද සහිතව) | |
| 13. (අ) 9 (ආ) iii කොටුවේ සඳහන් කෙරුණු කොමිස් මීළ ගෙවනු ලැබිය යුතු වූ නියෝජිතයාගේ නම හා ලිපිනය<br><br>13. (ආ) ගෙවන ක්‍රමය : හන්නා විට ................ අඩුකිරීමටය.<br>වෙනම යැවීමටය. | |

14. ඉල්ලුම් පත්‍රයට ආධාරවත් වනු පිණිස අමුණා ඇති වෙනත් ලියකියවිලි ලැයිස්තුව—

(අ)

(ආ)

(ඇ)

යථෝක්ත කොරතුරු සත්‍ය බවත් නිරවද්‍ය බවත් මම මෙයින් සහතික කරමි.

..................................................

ඉල්ලුම්කරුගේ අත්සන.

සැලකිය යුතුයි—

(අ) 9 වැනි කොටුවේ සඳහන් වන මිළ ගණන් හා වියදම් පහත සඳහන් වන ඒකකයන් අනුව දක්විය යුතු ය :—

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සියලු අන්දමේ වර්ගවලට හා තත්ත්වවලට මෙන්ම ඇසුරුම්වලට ද අයත් වන කොප්පරා හා පොල් තෙල්... | | | | | | රාත්තල් 2,240 ටොන් එක බැගින් |
| කොහු හෝ කොකෝවා | ... | ... | ... | ... | ... | හොණ්ඩර ගණනින් |
| පොල් ... | ... | ... | ... | ... | ... | ගෙඩි 1,000 බැගින් |
| කපාපු පොල් හා කුරුඳු | ... | ... | ... | ... | ... | රා. 100 බැගින් |
| වෙනත් භාණ්ඩ ... | ... | ... | ... | ... | ... | ගිවිසගත් ගාස්තුවේ ඒකකයන් අනුවය |

(ආ) නියම ශුද්ධ '' වාහන ගාස්තුව '' දක්විය යුත්තේ යෝග්‍ය වන පරිදි විලම්බිත හෝ මූල්‍ය ප්‍රතිදනය අඩුකර ගැනීමෙන් පසුව ය.

9—1000/2

---

## සමුපකාර සමිති පිළිබඳ ආඥා පණත (124 වෙනි අධිකාරය)

### සමුපකාර සමිති වසා දැමීමේ කටයුතු අවසන් කිරීම

සමුපකාර සමිති පිළිබඳ ආඥාපනතේ 52 (2) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමුපකාර සමිති ඒ එක එක ඉදිරියෙහි සඳහන් කර තිබෙන දිනයන්හි වසාදමන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ :—

| සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|
| 1. සීමාසහිත මහා පයාගල සමුපකාර ණය දෙන සමිතිය ... ... | 62.7.17 |
| 2. සීමාසහිත නබඳව සමුපකාර කඩ සමිතිය ... | 62.7.17 |
| 3. සීමාසහිත ජෝමාහන් දියගොඩ විවිධසේවා සමුපකාර සමිතිය ... ... | 62.8. 2 |
| 4. සීමාසහිත හෙප්පුමුල්ල සමුපකාර කඩ සමිතිය ... ... | 62.8. 6 |
| 5. සීමාසහිත කහටෝවිට සමුපකාර ණයදෙන සමිතිය ... ... | 62.8.22 |
| 6. සීමාසහිත කුකුල්නාපේ සමුපකාර කඩ සමිතිය | 62.8.27 |
| 7. සීමාසහිත නුගේතොට විවිධසේවා සමුපකාර සමිතිය ... ... | 62.8.27 |
| 8. සීමාසහිත රත්ගම මාවඩවිල ගෘහ සම්පාදක සමුපකාර සමිතිය ... ... | 62.8.27 |

රෝ. සමරසේකර,
සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් හා
සමුපකාර සමිති නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තැන.

1962.9.14 දින,
කොළඹ, තැ. පෙ. 419,
සමුපකාර දෙපාර්තමේන්තුව.

9-856

## නිවේදනයයි

වර්ෂ 1958 අංක 1 දරණ කුඹුරු පනතේ 51 වන වගන්තියේ 3 වන උප වගන්තිය යටතේ පහත උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ගොවිජන සේවා සහකාර කොමසාරිස් දෙවන තීරයේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්කයට තුන්වන තීරයේ සඳහන් දින සිට මාරු කරනු ලැබූ බව නිවේදනය කරමි.

ජේ. වී. ෆොන්සේකා,
ගොවිජන සේවා කොමසාරිස්.

1962 සැප්තැම්බර් 13 දින,
කොළඹදී ය.

| පළමුවන තීරය | දෙවන තීරය | තුන්වන තීරය |
| --- | --- | --- |
| තෙල්ගේ ගුණසෙන් පීරිස් | ... අනුරාධපුරය | ... 1962.8.13 |

9—883

---

## ලංකා දුම්රිය සේවය

**දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම**

කැලණිවැලි දුම්රිය මාර්ගයේ නාවින්න සහ මහරගම දුම්රිය ස්ථාන අතර සැ. 8, දම්, 25, පුරු. 26 දරණ ස්ථානයේ නුගේගොඩ-මහරගම පෞරාණික මහා මාර්ගය වැටී ඇති ස්ථානය අළුත්වැඩියාකිරීම සඳහා මෙම ඔක්තෝබර් 14 වැනි ඉරිදා පස්වරු 5.00 සිට 10.00 දක්වා රථ වාහන ගමනාගමනයට අර්ධ වශයෙන් වසා තබන අතර එදින රාත්‍රී 10.00 සිට පසුදා උදේ 6.00 දක්වා සම්පූර්ණයෙන් වසාතබනු ලැබේ.

මේ කාලය තුළදී රථ වාහන වෙනත් මාර්ගයන්ගෙන් ධාවනය කර විය යුතුය.

9-915/1

---

## ලංකා දුම්රිය සේවය

**දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම**

කැලණිවැලි දුම්රිය මාර්ගයේ රත්නපුර සහ තිරිවානකැටිය දුම්රිය ස්ථාන අතර සැ. 63, දම්. 64 දරණ ස්ථානයේ පළාත් ආණ්ඩු සභා සීමාව තුළ ඇති අභ්‍යන්තර රවුම්පාර වැටී ඇති ස්ථානය අළුත් වැඩියා කිරීම සඳහා මෙම ඔක්තෝබර් මස 13 වැනි සෙනසුරාදා රාත්‍රී 8.00 සිට 14 වැනි ඉරිදා පෙරවරු 8.00 දක්වා රථ වාහන ගමනාගමනය සඳහා වසා තබනු ලැබේ.

මේ කාලය තුළදී රථ වාහන වෙනත් මාර්ගයන්ගෙන් ධාවනය කර විය යුතුය.

9-915/2

---

## "සුරාබදු ආඥපනත" පිළිබඳ දැන්වීම්

සු.කො.—ඇල්.සී/ඊ. 259.

ඇල්.ඩී.—බී. 16/37.

### අංක 507 දරන සුරාබදු නිවේදනය

**සුරාබදු ආඥපනත**

1961 ජූලි 21 වෙනි දින අංක 12,553 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 493 වෙනි සුරාබදු නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කළ යුතු යයි (52 වෙනි අධිකාරය වන) සුරාබදු ආඥ පනතේ 25 වෙනි වගන්තියෙන් පවරනු ලැබූ බලතල ප්‍රකාර, කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු ඇමතිවරයා විසින් නියම කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

(1) (1) වෙනි ඡේදයෙහි, (අ) අනුච්ඡේදය වෙනුවට පහත සඳහන් අනුච්ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) තැබෑරුම පිහිටි වත්තේ අධිකාරි වෙත හෝ ඔහු විසින් ලියවිල්ලකින් නම් කරනු ලැබ, පළාතේ ආණ්ඩුවේ දිසාපති විසින් හා සුරාබදු කොමසාරිස් විසින් නිසියාකාර අනුමත කරනු ලැබූ තැනැත්තා වෙත ;" හා

(2) පළමුවෙනි උපලේඛනයෙහි 2 වෙනි කොන්දේසිය වෙනුවට පහත සඳහන් කොන්දේසිය ආදේශ කිරීමෙන් :—

"2 (අ) අනුච්ඡේදය යටතෙහි අධිකාරි විසින් නම් කරනු ලැබූ තැනැත්තා පිළිබඳ අනුමතිය ආණ්ඩුවේ දිසාපති හෝ සුරාබදු කොමසාරිස් යම් අවස්ථාවක අස්කරගන්නේ නම්, අධිකාරි විසින් වෙනත් තැනැත්තකු නම්කොට නිසියාකාර ඒ තැනැත්තා අනුමත කරනු ලබන තුරු තැබෑරුමේ පාලනය හා පරිපාලනය අධිකාරි විසින් ම වහාම බාර ගත යුතුය."

වී. එල්. වීරසිංහ,
ස්ථිර ලේකම්,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශය.

1962 සැප්තැම්බර් 14,
කොළඹ.

9-930

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණපිතයි